**The Speech delivered by Hon. Prime Minster at the opening ceremony of IBSL Towers on July 5, 2017**

**Dr. Indrajith Coomaraswamy, Governor, Central Bank of Sri Lanka**
**Mr. Samarasiri, Deputy Governor and Chairman IBSL**
**Members of the Governing Board of the IBSL**
**Ladies and Gentlemen**

I was amazed when I came to this building. In fact, I was telling the Governor that you start awarding degrees, any degree other than a medical degree. I think we have to upgrade our education, especially professional and post-graduate education. And I was speaking with him, after all, the Central Bank is also engaged in training for bankers, why done you combine to have some management. You may also be able to use that premises for some specific role connected to management of the economy and global economy. We are also undertaking restructuring of policy studies and establishing a School of Government. There is Japanese Government funded Miloda Building. We will ask them to take the next step and also fund the School of Government which means that we will have specialised schools and may be their own degree awarding process, all of them together. We will be calling you to discuss these issues in coming months.

I am honored to be here today to declare open this historic building of the IBSL. I am sure everybody here appreciates the encouraging but silent journey of the IBSL since 1964 without any burden to the government or to the public. I can imagine of enormous challenges that the IBSL could have encountered in this journey. I wish to place on record all those who gave their helping hand to win those challenges and to carry forward the IBSL to the current stage.

I am delighted to have this opportunity to address you all being high profile financial professionals. You are an essential part of the back-bone of our macro-economic management team. You are representing all sectors of the financial system, banks, financial institutions and financial markets.

As you know, the Central Bank is the monetary authority that issues money and maintains the monetary system. The rest of us uses that money as the intermediary to our transactions and to build wealth. We earn money, save money and invest money to make profit. Therefore, money generates banking, financial business and investments. As a result, financial assets are created in our books. To give you some figures, total gross assets held by all of us in the financial system that are financial institutions and markets, is estimated to be around Rs.

23 trillion. This does not count the money that is in the black market. This is nearly 2 times our annual GDP. Further, these assets are nearly 38 times the total value of currency printed by the Central Bank. We must be mindful that these financial assets have been created by us without any underlying real value or real wealth.

Therefore, money, banking and finance are the bread and butter of our economic lives. Their essential role is to be the intermediary of our economic transactions and pooling and redistribution of our saving for productive uses. The most productive use of money today not only in Sri Lanka but in the rest of the world is to spur rapid economic growth to create jobs and increase incomes of the people, in our case to create an export economy.

Finance also involves risk-taking of different degrees. Therefore, finance is something that has to be managed prudently by looking at long-term sustainability and not short-term profit. That is why the government is interested in keeping a financial safety net mechanism. It is the role of the state regulators to keep the system stable while individuals take care of themselves. This is the market mechanism we need to see in the financial sector of the economy. We

need financial businesses and risk management capacity building in which the IBSL will have a new role to play. Therefore, the role of training and academic institutes is second to none. Your institution is the lead institution in this sector. It is the training and skill development that help to keep resources in good use.

We enacted the Institute of Bankers of Sri Lanka Act No. 26 of 1979 as open economy came into being. I was a member of that Cabinet and a member of that House. Since then, this open market economy has matured creating enormous opportunities for development of our country and society. We are proposing an international financial center which will change the landscape of the financial system and the economy of Sri Lanka. This requires you to further modernize training and education system to fulfill the role expected by our

In this environment, I am sure that the IBSL Towers will take the IBSL to the forefront of the banking and finance education of the country. The IBSL must become the specialized national academy of banking and finance to offer graduate level training and qualifications as well. The IBSL Governing Board has to have a wider representation of professionals and academia to coordinate in both theory and practice. Its operational model has to be accredited by globally

recognized finance schools for quality while maintaining its local flavor. The overriding theme and focus of the IBSL training and qualification modules should be the prudent business and, not profit maximization. The IBSL should be in a position to produce financial managers for the hub of the Indian Ocean.

I am happy to work with the IBSL Governing Board to support these reform agenda fairly urgently in order to put the IBSL Towers into effective and productive use, rather than renting it out to earn some money. My legal team will be happy to review your SWOT (Strengths, Weaknesses, Opportunities and Threats) analysis and facilitate introduction of necessary legal amendments to empower the IBSL with a new market-based education mandate in the national interest. The restructuring of the IBSL will enable you to have a major responsibility in creating the financial framework of the proposed economy, of which I plan to say few words and to do so in Sinhalese.

ලබන තෙවසර තුල අපනයන ආදායමට බරවූ, ශීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථිකයකුත්, රැකියා බිහිකරන්න, ආදායම වැඩිකරන්න, එමෙන්ම සාමාන්‍ය ජනතාවට දැනෙන සංවර්ධනයකුත් ඇති කිරීමටයි අපි බලාපොරොත්තු වෙන්නෙ.

වසර 40 කට පෙර එනම් 1977 වසරේ නොවැම්බරයේ විවෘත ආර්ථිකයක් මෙරටට හඳුන්වා දුන්නා. එම නිසා නිෂ්පාදන භාණ්ඩ අපනයන වෙළෙඳ කටයුතු වැඩි වුණා. අපෙන් පසුවයි චීනය, ඉන්දියාව, වියට්නාමය එම මාර්ගයේ ගියේ. යුද්ධය නිසා අපේ වේගය අඩු වුණා. සෙසු රටවල සංවර්ධන වේගය

අඩු වුණේ නැහැ. අපිට සමාන මට්ටමේ සිටි තායිලන්තයත්, මැලේසියාවත්, ඉන්දුනීසියාවත් අපට පිටුපසින් සිටි චීනයත්, පසුව ඉන්දියාවත්, වියට්නාමයත් අප පසු කරගෙන ගොස් තිබෙනවා. දැන් අපට පිටුපසින් සිටින්නේ මියන්මාරයයි, කාම්බෝජයයි, ලාඕසයයි, ඇෆ්ගනිස්ථානයයි.

අපි මෙම අපනයන ආර්ථිකය දිහා ගමන් කරනකොට, වේගය අඩු වුණත්, පසුගිය දශකයේදී විපර්යාසයක් ඇති වුණා. අපගේ ආර්ථිකය වෙළෙඳ නොවන කටයුතු වලට බර වුනා. රටේ වර්ධනය ඇති වුණේ වෙළෙඳ නොවන කටයුතු වලිනුයි. ආර්ථිකයේ අපනයන නිෂ්පාදනයටත්, ඊට සම්බන්ධ ආයෝජනකරුවන්ටත්, අහිතකර ප්‍රතිපත්ති ක්‍රියාත්මක වුණා. ජී.එස්.පී. ප්ලස් සහනයෙන් ලැබෙන්නට තිබූ වාසිය අපි ප්‍රතික්ෂේප කළා. බංග්ලාදේශය එහි වාසිය ලබා ගත්තා.

අපනයන අඩුවන්ට සංවර්ධනය සඳහා රජය යටිතල පහසුකම් ඉදිකිරීම ආරම්භ කළා. මෙම යටිතල පහසුකම් ඉදිකිරීමට තම ආදායම නොතිබූ නිසා ණය මුදල් ලබා ගත්තා. ලංකාවේ වෙළෙඳපොළින් පමණක් නොව පළමුවරට අප විශාල වශයෙන් විදේශ වෙළෙඳපොලෙන් මුදල් ලබා ගත්තා. අප බලාපොරොත්තු වුනේ ඇමෙරිකාවේ, යුරෝපයේ එකල තිබූ ආර්ථික අර්බුදය නිසා මෙම මුදල් ලංකාවට ඇවිල්ලා කාලයක් තිබෙයි කියල. මෙම මුදල් hot money. මෙම මුදල් ලංකාවේ රැඳුණේ කෙටි කාලයක් පමණයි. එම මුදල් ආපසු යන්නට පටන් ගත්තා. ඒ නිසා සම්පූර්ණයෙන්ම යටිතල පහසුකම් ඉදිකරන්නට පටන් ගත්තා. උදාහරණ වශයෙන් ගතහොත් හම්බන්තොට වරාය, සූරිය වැව ක්‍රිකට් ක්‍රීඩාංගණය, හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාව. මේ ආයතනයේ අය ක්‍රිකට් ගහන්න කැමැති නම් අපට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය දෙන්න පුළුවන්. මේ සියල්ලටම අපි ණය ලබාගත්තා. අන්තිමට මෙරට තරුණ තරුණියන්ට නියම රැකියා තිබුණේ නැහැ. සමහරු මැදපෙරදිග ගියා. අමාරු රැකියා බාර ගත්තා. පවුල් කැඩුණා. අනෙක් තරුණයන් විශේෂයෙන්ම ත්‍රිරෝද රථ එලවන්න පටන් ගත්තා. ඒකට බොහෝ අය දොස් කිව්වා. ඒ අය මට කිව්වා මේ ආදායම හොඳයි . අපිට කර්මාන්ත ශාලාවක මේ ආදායම ලබා ගන්න බැහැ කියලා.

අන්තිමට ණය නොව පොලියවත් ගෙවා ගන්නට බැරි තත්ත්වයකට අපි පත්වුනා. 2015 වසර වන විට රට විශාල ආර්ථික අවුලකට යන බවට බොහෝදෙනා හිතුවා. ඒ කාලේ මහ බැංකුවේ සහ මහා භාණ්ඩාගාරයේ මා දන්නා අයට කතා කලා. ඔවුන්ගෙන් ඒ වාර්තාව තමයි මට ලැබුණේ. ඒ නිසා එවැනි අර්බුදයක් එන්නට පෙර වේලාසනින්ම ජනාධිපතිවරණයක් පැවැත්වීමට රාජපක්ෂ මහතා තීරණය කළා. සමහර රටවල ආර්ථික අර්බුදයක් එනවා නම් ඊට පෙර මැතිවරණ පවත්වනවා. එතැනදි අපිට භාරගන්න සිදුවුනා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම ආර්ථික මෙහෙයුම.

මම කැමතියි ශ්‍රී ලංකාවයි බංග්ලාදේශයයි සංසන්දනය කරන්න. 2004 දී ලංකාවේ අපනයන බිලියන 5 යි මිලියන 467 යි. අපිට වඩා බංග්ලාදේශයේ අපනයනය බිලියන 7 යි මිලියන 654 යි. අප ජී.එස්.පී. ප්ලස් ගත්තේ නැහැ. 2017 වන විට අපි බිලියන 10 යි. දෙගුණයක්වත් වැඩිවී නැහැ. බංග්ලාදේශය 2017 බිලියන 30 යි. එසේ නම් බංග්ලාදේශයේ අපනයනය තුන් ගුණයකටත් වඩා වැඩිවී තිබෙනවා. අපි එහෙම කලා නම් එම වසරේදී අපට ලැබෙන්නෙ ඩොලර් බිලියන 19 යි.

මොකක්ද බංග්ලාදේශයට වුනේ? ඒ අය පටන් ගෙන හෂීනා අගමැතිතුමිය අවුරුදු පහම අවසන් කරලා ඡන්දයට ගිහිල්ලා දිනුවා. ලංකාවේ එහෙම සිදුවුණා නම් සම්පූර්ණ කාලය ඉවර කරලා හොඳ ආර්ථිකයක් එක්ක ඡන්දයකට ගිහිල්ලා දිනන්න තිබුණා. එසේ වුණානම් මා මෙතැන නැහැ. අපි හුඟක් අය හිතනවා ආර්ථිකය අතපසු කර දේශපාලනය කරන්න පුළුවන් කියල. අමාරු වුණත් තීරණ අරගෙන ආර්ථිකය ඉදිරියට ගෙන යා යුතුයි. එම නිසා ගත යුතු අමාරු තීරණ අප පළමු වසර දෙකේදී අරගත්තා.

විශේෂයෙන්ම රට සංවර්ධනය කිරීමට අප පොරොන්දු වුණා. එම සංවර්ධනයට පෙර ආර්ථික ස්ථාවරභාවය අවශ්‍යයි. මඩවගුරේ ගෙවල් හදන්නට බැහැ. කොපමණ සංවර්ධයක් අවශ්‍ය වුවත් ආර්ථික ස්ථාවරභාවය නැතිව, උද්ධමනය නැතිව ඉදිරියට යන්න බැහැ. අප හිටියේ පොලියවත් ගෙවන්න බැරි ආර්ථිකයක.

එම නිසා විශේෂයෙන්ම ආර්ථිකය ස්ථාවර කරන්න ජාත්‍යන්තර මුල්‍ය අරමුදල ලබාදුන් සහයෝගය අප අගය කරනවා. ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙන් ආධාර ගන්නේ ඇයිදැයි බොහෝ අය ඇසුවා. අපි කිව්වා අපිට ඕන එකයි ගන්නෙ. අපට ඕන එක ලැබුණා. අප කණ්ඩායමට හැකි වුනා ජාත්‍යන්තර මුල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කර අවශ්‍ය මුදල් ගන්න.

විශේෂයෙන්ම ජාත්‍යන්තර මුල්‍ය අරමුදල ක්‍රියා කළේ අපේ දේශීය ආදායම වැඩිකිරීමටයි. එසේ කිරීමේදී වැට් බදු වැඩි කිරීමට සිදුවුණා. බැණුම් අසන්නටත් සිදුවුණා. ඒත් දැන් අපිට ණය පොලිය අපේ ආදායමෙන් ගෙවා දාන්න පුළුවන්. ඒ ටික කරන්න අපි ස්ථාවරභාවයකට පැමිණියා. මෙතැන් සිට ඉදිරි පියවර කිහිපයක් තියෙනවා. ආර්ථිකයේ ස්ථාවර බව තහවුරු කර ගන්න. නමුත් අපට සම්පූර්ණ ණය ගෙවා දැමීමට ශක්තියක් නැහැ. අප විදේශ ආයෝජන ලබාගැනීමට ක්‍රියා කරන්නේ තව අවුරුදු පහ, හයකින් අපගේ දළ දේශීය නිෂ්පාදිතය ශීඝ්‍රයෙන් වර්ධනය වූ පසුව එම ආදායමත් ණය ගෙවීම සඳහා යෙදවීමට හැකිවෙනවා. ඒ වනතුරු අපට සිදු වෙනවා ආපසු ණය ගැනීමට. මෙවර ණය ගන්නේ ණය ගෙවීමට මාර්ගයක් නැතිව නොවේ. දැක්මක් ඇතිව. වසර පහක්, දහයක් යන විට මෙම ණය ගෙවීමට අපට මුදල් තියෙනවා. ඒ එක්කම දළ දේශීය නිෂ්පාදනය දෙස බලන විට අපේ ජාතික ණයභාවය 79% සිට 70% දක්වා අඩු කර ගන්නට අපට හැකිවුණා. ඊට පසු 60% දක්වා අඩු කිරීමට අප ක්‍රියා කළ යුතුයි.

මේ වන විට මහ බැංකුවෙන් කෙටි හා මධ්‍ය කාලීන ණය පාලනය කිරීමේ උපක්‍රමයක් ඉදිරිපත් කර තිබෙනවා. එය සංශෝධනය කිරීමෙන් පසුව ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

ඊට හේතුව 2019 සිට 22 දක්වා එක් අවුරුද්දකට අඩුම වශයෙන් විදේශ ණය ඩොලර් බිලියන එකක් ගෙවන්න වෙනව, වැඩි වශයෙන් බිලියන දෙකක් ගෙවන්න වෙනව. එම අවුරුදු හතර ඇතුළත එම ගණන ගෙවීමට සිදුව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමට අපට සිදුවනවා. ඒවගේම අපේ අයවැය තදින් පාලනය කිරීමටත් සිදුවෙනවා. සමහර විට සතියක් තුල විශාල ණයක් ගෙවන්න සිදු වෙනව. ඒ නිසා අලුත් වෙන්දේසි ක්‍රමයක් ආරම්භ කර තිබෙනවා සැලැස්මක් අනුව. මහ බැංකුව සහ භාණ්ඩාගාරය මේ දිනවල සාකච්ඡා කරමින් සිටිනවා. ඒ වගේම නව වෙන්දේසි ක්‍රමයක් ගෙනවිත් තිබෙනව. ඒ වෙන්දේසි ක්‍රමයත් අපි ක්‍රියාත්මක කරනව.

ණය ගෙවන්ට වෙනම ජාතික ණය කාර්යාලයක් ඇති කරල එම ණය කාර්යාලය මහ භාණ්ඩාගාරය සමඟ වැඩකරන්න යොදවනවා. මම කිවුව භාණ්ඩාගාරය තමයි මෙහෙම ණය ගත්තෙ. ඒ නිසා ණය ගෙවන යාන්ත්‍රණයත් භාණ්ඩාගාරයටම තබා ගන්න කියල. අපේ එක අත්දැකීමක් තමයි මහ බැංකුව යෙදෙව්වෙ භාණ්ඩාගාරයේ ණය ගන්න. අනෙක් පාලන කටයුතු කළේ නැහැ. එම නිසා මහ බැංකුවයි භාණ්ඩාගාරයයි වෙන් කරල ක්‍රියාත්මක කරගන්න අප තීරණය කළා. එහි ප්‍රතිඵලයක් තමයි අපි අද දකින්නේ. දෙවනුව සාකච්ඡා කරල තියෙන්නේ උද්ධමනය අඩුකිරීම. අප මෙම වසරේදී 6% ආර්ථික වර්ධන වේගයක් බලාපොරොත්තු වුනා. එහෙත් නියඟය සහ ගංවතුර තත්ත්වයන් නිසා එය අඩු වුණා. වැට් වැඩි කිරීමේ මූලික බලපෑම, බඩු හිඟයක් තිබුන, මේ සියලු දේ පාලනය කරමින් අඩුපාඩු හදාගෙන ඉදිරියට යන්න වෙනවා. කෘෂි නිෂ්පාදනය සමහර විට අපට ගබඩා කරන්න බැහැ. වෙළෙඳපොලට රැගෙන ඒමට තරම් ශක්තියකුත් නැහැ. මෙවැනි පසුබිමක් මත මෙම වසරේදි අප විශාල සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා තමයි විශේෂයෙන්ම ආර්ථික වර්ධනය සහ රැකියා බිහි කිරීමේ උපක්‍රම පිළිබඳවත් අප සාකච්ඡා කරනවා. ඒ සඳහා විවිධ අමාත්‍යාංශයන්ගෙන් අදහස් ලැබී තිබෙනවා. මහ බැංකුවෙන් මූලික වාර්තාවක් සකස් කරල තියෙනව. හර්ෂ ද සිල්වා අමාත්‍යතුමාට ඒ සම්පූර්ණ වාර්තාව සකස් කිරීමට අප භාරදී තිබෙනවා.

අපි දැන් ඉඳලා ක්‍රියාත්මක වෙනව. මේ අවුරුද්දේ මුල් භාගයේ පටන් ගත්තෙ. කුලියාපිටිය, පන්නල, කොග්ගල, කළුතර වැඩසටහන් පටන් ගෙන දැන් එම කර්මාන්ත ශාලාවල ඉදි කිරීම් කටයුතු සිදු වෙනවා. හම්බන්තොට වැඩසටහනුත් ඉදිරි මාස දෙක, තුන තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ වන විට අලුත් අය අපෙන් ඉල්ලනව ආයෝජන සිදු කිරීමට. කොහොමද ආයෝජනය කරන්නෙ? හම්බන්තොටට විශාල පිරිපහදු මධ්‍යස්ථානයක්. ආයෝජකයන් එනව එල්එල්ජී විදුලි බලාගාරයක් සකස් කරන්න. එහෙම වැඩසටහන් කිහිපයක් තියෙනව හදන්න. කොළඹ මුල්‍යා නගරයට ගොඩනැගිලි ඉදි

කිරිමට දැන් සූදානම් වෙනව. ඉන්දියාව සහ ජපානය ඒකාබද්ධ වී එල්එල්ජී විදුලි බලාගාර දෙකකුයි, පාවෙන ටර්මිනල් දෙකකුයි තිබෙනවා. මෙවැනි වැඩසටහන් කිහිපයක් තියෙනව.

අපි බලන්නෙ යටිතල පහසුකම් වැඩි නුවර සිට හම්බන්තොට දක්වා විශේෂ ආර්ථික කලාපයක් ඇති කිරීමට. වරායවල් දෙකකුයි, ගුවන් තොටුපල දෙකයි. අනාගතයට දැන් සිංගප්පූරුවෙන් සමාගමක් ඇවිල්ල තියෙනව ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අනුරාධපුරය, දඹුල්ල සහ මඩකලපුව එක්ක සැලැස්මක් ඇති කරන්න. විශේෂයෙන්ම කර්මාන්ත සහ සංචාරක ව්‍යාපාරයට. ඒ ආකාරයට අපිට ඊසාන දිග සහ නිරිත දිග ආර්ථික කලාප දෙකක් ඉදිරියට ගෙන යනවා. එතැනින් අපිට නව ආයෝජන ලබා ගැනීමට තියෙනව.

අප රටේ ව්‍යාපාර සියල්ල දේශීය වෙළෙඳපලට නිෂ්පාදනය කලත් විදේශීය වෙළෙඳපලට නිෂ්පාදනය කලත් අනිත් රටවල වගේ සියල්ලම ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී විය යුතුයි. දෙවනුව සමහර විට අපේ සමහර ව්‍යාපාර ලංකාව තුළ තරග කිරීමට වාතාවරණයක් නැහැ කියල බංග්ලාදේශයට සහ මියන්මාරයට යනවා. එය අපට නවත්වන්න බැහැ. එහෙම ගිහින් ඇති කරන එක හොඳ දෙයක්. අපේ සම්බන්ධය වැඩි වෙනව. අපි බෙංගාල බොක්කේ රටවල් එක්ක, චීනය එක්ක, ඉංදියාව එක්ක දියුණු වෙලා. අපිට දැන් ජී.එස්.පී. ප්ලස් ලැබි තිබෙනවා. දැන් අපිට ඇති අභියෝගය ජී.එස්.පී ප්ලස් සහනයෙන් ලැබෙන භාණ්ඩ හය දහසින් කීයක්ද අපි යවන්නෙ කියල. අප ඇඟළුම් වලටයි, රබර් ටයර් වලටයි, ධීවර බඩු වලටයි සීමා වෙනවාද? ඒකෙන් අපිට ප්‍රයෝජනය ගන්න පුළුවන්ද ලාංකික ව්‍යාපාරයන්ට? විදේශ අය එතැනින් ප්‍රයෝජනය ගන්නව තව අවුරුද්දක් දෙකක් යන කොට. ඒත් අපිට ශක්තිය තියෙනව අපේ ආයතන සමග වැඩ කරන්න. මූල්‍ය ක්ෂේත්‍රයත් බැංකු ක්ෂේත්‍රයත් මීට සම්බන්ධ වෙන්න තියෙනව. අන්න එහෙම ආර්ථිකයක් ඇති කරන්නයි අපි මේ අවුරුදු තුනේ ක්‍රියාත්මක කරන්නෙ.

මම අද මෙම ස්ථානයට පැමිණෙන විට සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ සිසුවියන් හතර දෙනෙක් ජය මංගල ගාථා ගායනා කළා. මට අවශ්‍ය එම හතර දෙනාට විශාල ණය බරක් නැති ලංකාවක් දෙන්න. මේ පව් අපි ඔවුන්ට දාන්න හොඳ නැහැ. අපිම එය විසඳා ගන්න ඕන. මට අවශ්‍ය ඔබේ දරුවන්ට බරක් නැති, හොඳ ආදායමක් තියෙන නීතිය සාමය ගරු කරන රටක් ඇති කරන්න ආර්ථික වශයෙන් විශාල කේන්ද්‍රයක් හැටියට. ඒකයි අන්තිම අරමුණ. මේ සියල්ල එතැනට යන්න උපක්‍රම. මේ ඔක්කොම කරන්න නම් ඔබේ ක්ෂේත්‍රය විශාල සේවයක් කරන්න ඕන. අන්තිමට බුක්ති ලබන්නේ වෙන කෙනෙක් නොවෙයි ඊළඟ පරපුරයි. අපි බලාපොරොත්තු වෙනව මේ අවුරුද්දේත්, එන අවුරුද්දේත් මේ ක්ෂේත්‍රයෙන් විශාල වැඩ කොටසක් කරන්න සිදුවෙයි කියල. මොකද මේ යන වැඩ සටහන අනුව වැඩි බරක් පැටවෙන්නේ පෞද්ගලික අංශයටයි.

ඉතින් මට මේ ගැන කථා කරන්න අවස්ථාවක් ලබාදීම ගැන සමරසිරි මැතිතුමාටත්, මෙම ආයතනයටත් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.